# ඓතිහාසික පැළුණුගල සෙල්ලිපිය පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක්.

**සෙව්වන්දි කේ.ඩී.සී.**[1]

කළුතර දිස්ත්‍රික්කයේ දියගම ගම්මානයේ පෞද්ගලික ඉඩමක පිහිටි පැළුණුගල සෙල්ලිපිය මුල් කොට ගෙන මෙම අධ්‍යයනය සිදු කර ඇත. එහිදී පර්යේෂණ ක්‍රමවේදය වශයෙන් සාහිත්‍ය මූලාශ්‍ර, ක්ෂේත්‍ර අධ්‍යයනය හා සම්මුඛ සාකච්ඡා යොදා ගැනුණි. ඓතිහාසික වටිනාකමින් යුත් එම සෙල්ලිපිය පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව යටතේ සංවර්ධනය වුවද අද වන විටත් පෞද්ගලික ඉඩමක පැවතීම ගැටලුවකි. එම සෙල්ලිපියෙහි වැදගත්කම හේතුවෙන් වරින් වර පුද්ගලයින් මෙම ඉඩම වෙත පැමිණෙන අතර ඒ සඳහා ඉඩම් හිමියාගෙන් අවසර ගැනීමේදී ඇති වන අපහසුතාවය මඟහැර ගැනීමට පිළියමක් යෙදීම මෙම අධ්‍යයනයේ අරමුණයි. කලුතර කලුගං මෝදර සිට සැතපුම් තුනක් පමණ කලු නදියේ ඉහළ පැරණි තොටුපළක් අසළ පැළුණු ගල නම් වූ පර්වතයට නුදුරින් පිහිටි ඉඩමක මෙම ශිලා ලේඛනය පිහිටා ඇත. මෙම සෙල්ලිපියේ අක්ෂර පිළිබඳ විවිධ වූ අර්ථකථන පැවතිය ද සමස්ථ අදහස ලෙසින් කලුතර පැවති මහා කාලක නම් විහාරයට කරන ලද පූජාවක් ගැන පවතින්නා වූ සඳහනක් ලෙස දැක්විය හැකිය. කලුතර ප්‍රදේශයේ ඕනෑම ස්ථානයක ඉතිහාසය ගැන අධ්‍යයනය කිරීමේදී මෙම සෙල්ලිපිය වැදගත් මූලාශ්‍රයක් බව කිවයුතු කරුණකි. මෙම ලිපියේ වැදගත්කම වන්නේ අනුරාධපුර යුගය බඳු, දුරාතීතයේ රයිගම් කෝරළය හා පස්දුන් කෝරළය සිංහල බෞද්ධ ජනතාවගේ ජනාවාසව දියුණුව පැවතීමයි. මෙම ලිපිය පළමු වරට සොයා ගෙන ඇත්තේ වස්කඩුවේ ශ්‍රී සුභූති ස්වාමීන් වහන්සේය. 1891දී සෙල්ලිපි පිළිබඳ විශේෂඥයෙකු වූ ජර්මන් ජාතික මියුලර් නැමැත්තා විසින් පළමු වරට එම සෙල්ලිපිය කියවා ඇත. ඔහුගේ මතය අනුව මෙම විහාරයට කරන ලද පරිත්‍යාගයක් පිළිබඳව ලියවූවක් ලෙස දැක්වේ. එම අදහස වැරදි බව පෙන්වා දෙමින් සී. ඩබ්ලිව් නිකලස් මහතා විසින් මහා කාලක මහා වෙහෙරක් පැවති බවට අදහස් දක්වයි. මෙම කියවීම අනුව අනුරාධපුර යුගයේ දී කැළණිය කේන්ද්‍රකරගත් මායා රාජධානිය කලු ගඟ දක්වා පැතිර පැවති බව සනාථ වේ. ඉන් පසුව නැවතත් 1991දී සී. ජයසිංහ මහතා විසින් මෙම ලිපිය ක්‍රිස්තු පූර්ව 1 වන සියවසේ ලියවී ඇති බවට අදහසු දක්වා ඇත. මෙය අනුරාධපුර යුගයේදී පිහිටවන්නට ඇතැයි සැක සහිතය. පුරාවිද්‍යා අංශයෙන් දැන්වීම් පුවරු සවිකර තිබියදී ඓතිහාසික වටිනාකමින් හෙබි ජාතික දේපළක් වන මෙය පෞද්ගලික ඉඩමක පැවතීම පිළිබඳව බලධාරීන් සොයා බැලිය යුතුය. එම ඉඩමෙහි සෙල්ලිපිය පිහිටුවා ඇති බිම් කොටස පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව විසින්, එම ඉඩම් හිමියාට ද සාධාරණයක් ඉටුකර රජයේ භාරයට ගැනීමට කටයුතු කරන්නේ නම් එහි ආරක්ෂාව තවත් ශක්තිමත් වනවාසේම ඕනෑම පුද්ගලයෙකුට ඕනෑම අවස්ථාවක එය නරඹා දැනුම ලබා ගැනීමට යාමේදී ඇති වන අවහිරතාවය මඟහැරෙනු ඇත.

**ප්‍රමුඛ පද :** දියගම ගම්මානය, ඓතිහාසික, පැළුණුගල සෙල්ලිපිය

---

[1]පුරාවිද්‍යා හා උරුම කළමනාකරණ අධ්‍යන අංශය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය.
kdcsewwandi1997@gmail.com